මැදවච්චිය එල්ලංගාව කළමනාකරණ පැතිකඩ

හා මූලික සංවර්ධන සැලැස්ම



මැදවච්චිය එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව

නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

නවගත්තේගම

ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය විසින්

ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය

වයඹ පළාත

1.	හැඳින්වීම…………………………………………………………………	**1**
1.1	ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම………………………………	1
1.2	මැදවච්චිය එල්ලංගාව හා එහි පිහිටීම…………………………………………………...	3
1.2.1	මැදවච්චිය එල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු……………………………………..	5
1.2.2	එල්ලංගාවේ සාමාන්‍ය තොරතුරු…………………………………………………..	6
1.3	මැදවච්චිය එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම…………...	8
1.4	එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම………………………………………..	**9**
1.5	එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය………………………………..	12
1.6	එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය……………………………………..	12
1.7	මැදවච්චිය එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය………………	12
1 .8	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු.	14
1.9	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම………………………………………………………………………..	15
2.	එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ක්‍රමවේදය……….	16
2.1	තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම……………………………………..	17
2.2	මැදවච්චිය එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම…………………..	18
3.	මැදවච්චිය එල්ලංගාවේ වර්තමාන පැතිකඩ……………………………………...	20
3.1	භූ විද්‍යාත්මක (Geological) තොරතුරු……………………………………………	20
3.2	ජල විද්‍යාත්මක තොරතුරු…………………………………………………………	21
3.3	පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු……………………………………	22
3.4	එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු………....	23
3.5	සමාජ ආර්ථික තොරතුරු………………………………………………………….	24
3.6	එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් කටයුතු පිලිබඳ තොරතුරු……….	25
3.7	එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා පිලිබඳ තොරතුරු………………	25
3.8	මැදවච්චිය එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය පිලිබඳ තොරතුරු……………...	26
04.	එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග……………………………………………..	32
4.1	එල්ලංගාවේ උග්‍ර ගැටළු……………………………………………………………	32
4.2	උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්……………	34
5.0	යෝජිත උපාය මාර්ග සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව හා සම්බන්ධිතයන්…	38

6.0 ඇස්තමේන්තුගත වියදම………………………………………………………… 44

7.0 ක්‍රියාත්මක සැලැස්ම………………………………………………………………… 44

ඇමුණුම්……………………………………………………………………………….. 45

01. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයක් වන අතර එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසාර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ ඉතාමත් විශිෂ්ඨ නිර්මාණයක් වන එල්ලංගාව ආරක්ෂා කර සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය" මගින් සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මග පෙන්වීම සිදුකරයි. එල්ලංගාවේ සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් එහි සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරණ කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමයි.

1.1 ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම

නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල එල්ලංගා 03 ක් පිහිටා ඇත. මැදවච්චිය ආච්චිගම හා පහල වගයාමඩුව එම එල්ලංගා වේ. මෙම එල්ලංගා වල පිළිවෙලින් 20, 13 හා 16 වශයෙන් වැව් පිහිටා ඇත. ආච්චිගම හා පහල වගයාමඩුව එල්ලංගා ව්‍යාපතිය (දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපාතිය) මගින් මැනුම් කලද ඒවා දැනට පුණරුත්ථාපනය නොවේ. මැදවච්චිය එල්ලංගාවේ පිහිටි වැව් 20 න් පුණරුත්ථාපනය වන්නේ වැව් 12 ක් පමනි. මැදවච්චිය එල්ලංගාව මී ඔය ද්‍රෝණියේ පිහිටා ඇති අතර ආච්චිගම හා පහල වගයාමඩුව එල්ලංගා නාන්නේරිය ඔය මී ඔය ද්‍රෝණිය තුලම පිහිටා ඇත. මේවාගේ ජලය අවසන් වශයෙන් නාන්නේරිය අතු ඔය මගිනි. තබ්බෝව ජලාශයට ජලය ගලා බසී. මැදවච්චිය එල්ලංගාව තම්මැන්නා වැටිය ග්‍රාම නිලධාරි වසමට අයත් වන අතර ආච්චිගම හා පහල වගයාමඩුව එල්ලංගා මහ මැද්දාව හා මීයැල්ලෑව ප්‍රදේශ වල පිහිටා ඇත. තවද කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයේ නෙලිවැව එල්ලංගාව ද පිහිටා ඇත. වනාතවිල්ලුව සමනළවැව එල්ලංගාව මැදවච්චියට කි.මී. 30 ක් පමන දුරින් පිටා ඇති අතර මෙම එල්ලංගා වල සීමාවන් එකිනෙකට ආසන්නව පිහිටයි.

ප්‍රදේශයේ ඇති වෙනත් එල්ලංගා දැක්වෙන සිතියම

සිතියම් 1



1.2 මැදවච්චිය එල්ලංගාව හා එහි පිහිටීම

පුත්තලම දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවගත්තේගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ තම්මැන්නාවැටිය ග්‍රාම නිලදාරී කොට්ඨාශය ආවරණය කරමින් මෙම එල්ලංගාව පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට මීටර් 57.5 ක පමණ උන්නතාංශයකින් පිහිටා ඇති මැදවච්චිය එල්ලංගාව මී ඔය ද්‍රෝණියේ පිහිටියේය. ගොවි සංවිධාන (FOs) 03 ක් සහ (GN) ග්‍රාම නිලධාරී කොට්ඨාශ 01 ක් එල්ලංගාව තුල පිහිටා ඇත. එල්ලංගාව වැව් 20 කින් සමන්විත වේ. ව්‍යාපෘතිය මගින් වැව් 12 ක් ප්‍රතිසංස්කරණය කරනු ලබයි. මෙම එල්ලංගාවේ භූමි ප්‍රමාණය ව. කි.මී. 16.5 කි. හෙක්. 1660 ක්, පවුල් 324 ක් මෙම එල්ලංගාව තුල ජීවත්වන අතර මුලු ජනගහනය 825 කි. බටහිර සිට නැගෙනහිර දිශාවට කි.මී.10 ක් පමන විහිදී යන එල්ලංගාව කි. මී. 3.5 පමන පලලින් යුක්තවේ. බටහිර මායිමේ මැදවච්චිය වැව පිහිටා ඇත. ඒ අනුව නැගෙනහිර සිට බටහිර දෙසට බෑවුම් වන පරිදි එල්ලංගාව පිහිටා ඇති මෙම එල්ලංගාව තරමක් කුඩා එල්ලංගාවකි.

මොට්ඨාශ නම් රජකු මෙහි රජකර ඇතිබවත් ඔහුට සමාන ශාරීරික ලක්ෂණයන්ගෙන් යුත් තවත් පුද්ගලයෙක් එම රජවාසලේ සේවය කර ඇති බවත් විටින් විට මේ දෙදෙනා තම රාජකාරී හුවමාරු කරගෙන විනෝද වූ බවත් දිනක රජ වාසළ සේවකයා රජු මෙන් වෙස් වලාගෙන සිටි අවස්ථාවක ඔහු විසින් රජුව හිසගසා මරාදැමූ බවත් ජනප්‍රවාද වල කියවේ. සුප්‍රසිද්ධ සාහිත්‍යධරයකු වූ සයිමන් නවගත්තේගමයන්ගේ සුභ සහ යස වේදිකා නාට්‍යට මෙම ජනප්‍රවාදය මුල් වූ බවට ගැමියන් තුල මතයක් පවතී. මොට්ට මොලේ ගල හා පිච්චෙන්ඩියාව කන්ද පිලිවෙලින් මීටර් 80 හා 125 පමන උසින් පිහිටා ඇත. වර්ථමානයේ මෙම ස්ථාන වල විහාරස්ථාන පිහිටා ඇත.

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මැදවච්චිය එල්ලංගාව

වගු අංක - 01

අංක	ග්‍රානි. කොට්ඨාශයේ නම හා අංකය	ව්‍යාප්තිය ව.කි.මී.	ජනගහනය			ප්‍රදේශය තුල ගොවි සංවිධාන
			ස්ත්‍රී	පුරුෂ	එකතුව	
01	තම්මැන්නාවැටිය - 646	16.5 (හෙක්. 1650)	428	297	825	3

සිතියම් - 2



1.2.1 මැදවච්චිය එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු

එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු වගුව

වගුව - 2

අංකය	ටැංකියේ නම	පුනරුත්ථාපනයෙන් පසු ධාරිතාව වැඩි විම	FSL ධාරිතාව (අක්කර අඩි)	අපේක්ෂිත FSL ධාරිතාව පුනරුත්ථාපනයෙන් පසු (අක්කර අඩි)	පුනරුත්ථාපනයෙන් පසු අපේක්ෂිත ධාරිතාව වැඩිවීම
1	හල්මිල්ලැව වැව	2.71	326.04	328.75	2.71
2	පහළ සඳනාන්කුලම වැව	7.55	198.22	205.77	7.55
3	තම්මැන්නාවැටිය වැව	2.76	65.89	151.00	85.11
4	පිච්චෙන්දියාව වැව	3.99	120.30	124.29	3.99
5	වෙලේ වැව	16.59	62.44	79.03	16.59
6	M3	-	-	-	-
7	ගල්ලැව වැව	10.11	24.38	34.48	10.11
8	දෙමට වැව	5.38	34.55	46.97	12.42
9	ඉහළ සඳනාන්කුලම වැව	4.40	24.23	28.63	4.40
10	අතුරුපොලයාගම වැව	5.50	144.27	149.77	5.50
11	M1	-	-	-	-
12	පහළ කුත්තිකුලම වැව	5.78	94.06	99.84	5.78
13	ඉහළ කුත්තිකුලම වැව	5.02	69.71	96.52	26.81
14	සෙංගක්කුලම වැව	38.03	335.82	408.76	72.94
15	M4	-	-	-	-
	මුළු	107.83	1499.92	1753.84	254

එල්ලංගාවේ වැව් ධාරිතාවය හා කුඹුරු ප්‍රමාණය

වගුව - 3

අනු අංක	වැවේ නම	ග්‍රාම නිළධාරි වසම	ජල ධාරිතාවය අක්කර/අඩි	කුඹුරු (හෙක්)	ගොවින් සංඛ්‍යාව
1	හල්මිල්ලෑව වැව	තම්මැන්නාවැටිය	326.04	26.8	86
2	පහළ සඳනන්කුලම වැව	තම්මැන්නාවැටිය	198.22	41.6	115
3	තම්මැන්නාවැටිය වැව	තම්මැන්නාවැටිය	65.89	10.8	70
4	පිච්චෙන්දියාව වැව	තම්මැන්නාවැටිය	120.30	08	13
5	වෙලේ වැව	තම්මැන්නාවැටිය	62.44	12.4	90
6	M3	තම්මැන්නාවැටිය	-		
7	ගල්ලෑව වැව	තම්මැන්නාවැටිය	24.38	03	06
8	දෙමට වැව	තම්මැන්නාවැටිය	34.55	11.5	05
9	ඉහළ සඳනන්කුලම වැව	තම්මැන්නාවැටිය	24.23	04	02
10	අතුරුපොලයාගම වැව	තම්මැන්නාවැටිය	144.27	20.8	68
11	M1	තම්මැන්නාවැටිය	-		
12	පහළ කුත්තිකුලම වැව	තම්මැන්නාවැටිය	94.06	12	25
13	ඉහළ කුත්තිකුලම වැව	තම්මැන්නාවැටිය	69.71	12.8	33
14	සෙංගක්කුලම වැව	තම්මැන්නාවැටිය	335.82	110.5	160
15	M4	තම්මැන්නාවැටිය	-		
	මුළු			274.2	673

1.2.2. මැදවච්චිය එල්ලංගාවේ සාමාන්‍ය තොරතුරු

වගු අංක - 04

තොරතුරු	විස්තරය
දිස්ත්‍රික්කය	පුත්තලම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	නවගත්තේගම
මැතිවරණ බල ප්‍රදේශය	ආණමඩුව
ගංගා ද්‍රෝණියේ නම	මීඔය ගංගා දෝණිය
එල්ලංගාවේ නම	මැදවච්චිය එල්ලංගාව
ගොවිජන සේවා බල ප්‍රදේශය	නවගත්තේගම
ග්‍රාම නිලධාරී වසම	තම්මැන්නාවැටිය

එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්.	ව .කි .මී. 16.5 (හෙක්. 1650)
ජලපෝශක ප්‍රදේශයේ නම	මැදවච්චිය
පැහැදිළි ජල පෝෂක සංඛාව	15
කෘෂිකාර්මික කටයුතු සඳහා බාවිතා කරණ වැව් සංඛ්‍යාව	17
සීමාසහිත වනාන්තර ප්‍රදේශ නම්	තම්මැන්නාවැටිය
එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව	324
වන ආවරණය	හෙක්. 547

සිතියම් - 3



මැදවච්චිය එල්ලංගා පද්ධතියේ සිතියම හා හරස්කඩ චාරිකා ගමන් මග

1.3 මැදවච්චිය එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම

මැදවච්චිය එල්ලංගාව ව.කි.මී. 16.5 කි. එහි වැව් 20 ක් පිහිටා ඇත. එම වැව්වල දල වශයෙන් හෙක්. 868 ක් පමණ මහ කන්නයේ කුඹුරු වගා කරයි. ගොඩ බෝග වගාව හෙක් 620 ක් පමන වන්නේ හේන් වගාවත් සමගයි. එම ගොවීන් සංඛ්‍යාව 762 ක් පමන වේ. කුඹුරු හා ගොඩ බෝග වගා නොකරන එහෙත් කෘෂි ආශ්‍රිත කටයුතු වල නිරත වන සංඛ්‍යාව 375 ක් පමණ වේ. සෙසු අය ශ්‍රමිකයන්, රැකියා නොකරණ හා වැඩිහිටි ජනගහනයයි. විදේශ රැකියා වල නියුතු වූවන් 37 ක් පමන වන අතර විශ්‍රාමිකයන් 58 කි. කෙසේ වූවද මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකාව හා අදාල ලේඛණ පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වෙමින් පවතින බව අනාවරනය විය. කෙසේ වූවද එල්ලංගාවේ පිහිටි වැව් 20න් 12 ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගෙන ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර මැදවච්චිය එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමණාකරන කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලබයි.

1.4. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්, "එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

එල්ලංගාවක ආකෘතියක්



ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති තත්වයෙන් එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.
ඒවා නම්,

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන
- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමණාකරන කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය
- පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය සභාව
- සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක

කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත. තව දුරටත් ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනින් දක්වා ඇත.

සටහන් 1: එල්ලංගා පද්ධති කළමණාකරනය හා සම්බන්ධිත ප්‍රධාන ආයතනික ව්‍යුහය

1.5 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක් ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට බීමට, රෙදි සේදීමට, ආහාර පිසීමට සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රාජ්‍ය, පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරගත යුතුය. එසේ වුවද නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක්විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහාත් ක්‍රියාමාර්ග ගැනීමටත් වඩාත් අවශ්‍ය වී ඇත.

1.6 එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික චත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් වූ අතර වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලැබිය. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

1.7 මැදවච්චිය එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ තම්මැන්නාවැටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල මැදවච්චිය එල්ලංගාව පිහිටා ඇත. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල තෝරාගත් ප්‍රතිලාභීන් වෙත විවිධ ආර්ථික කටයුතු ක්‍රියාවට නංවා ඇත. ආදර්ශ ගෙවතු වගාව, වගා ළිං ඉදිකිරීම, සත්ව පාලනය, වැව් පුනරුත්තාපනය හා නවීන කෘෂිකර්ම

ක්‍රමවේදයන් හඳුන්වාදීම, ආයතන සංවර්ධනය ඉන් ප්‍රධාන වේ. මෙසේ ක්‍රියාත්මක වන සියලු ක්‍රියාකාරකම් නිෂ්පාදන සංවිධාන හා නිෂ්පාදන සංගම් ගොවි සංවිධාන හරහා ක්‍රියාත්මක වේ. මෙම කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට හා නියාමනය කිරීම සඳහා මධ්‍ය සංවිධානයක අවශ්‍යතාවය අවශ්‍යම විය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් වැව් පුනරුත්ථාපනය වෙමින් පවතින මැදවච්චිය එල්ලංගාව කේන්ද්‍ර කරගෙන 2023.02.24 දින එල්ලංගා කළමනාකරණ කමිටුවක් පිහිටුවන ලදී. මෙම කමිටුව නවගත්තේගම ප්‍රාදේශිය ලේකම්ගේ සභාපතිත්වයෙන් හා අදාල සියලු රාජ්‍ය ආයතන හා ස්වේච්ඡා සංවිධානවල සහභාගිත්වයෙන් ද බල ප්‍රදේශයේ සියලුම ගොවි සංවිධාන වලින් ද මෙම කමිටුව සමන්විත වේ. මෙම කමිටුවේ ලේකම් ධූරය දරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්ථමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරී විසිනි. ලෝක බැංකුවේ හා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ උපදෙස් අනුව ක්‍රියාත්මක වන මෙම කමිටුවට ඉතා භාරදූර වගකීමක් පැවරිණි. නිරන්තරයෙන් වැව් නඩත්තු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් සමස්ථයක් වශයෙන් වැව් පද්ධතියමඇතුලත්වන එල්ලංගාව වශයෙන් සැලකිල්ලට ගෙන සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය බවත් ඒ සඳහා එල්ලංගාවේ පවතිත තත්වය ප්‍රථමයෙන් අවබෝධ කරගැනීමත් අත්‍යවශ්‍ය විය. ඒ සඳහා එල්ලංගාව තුල ඇවිද ගොස් තොරතුරු රැස්කර ගැනීමටත්, එම දත්ත හා ආයතනමය වශයෙන් ලබා ගන්නා දත්ත පදනම් කරගෙන මූලික වශයෙන් හරස්කඩ වාර්තාව (පැතිකඩ Cascade Profile) සකස් කිරීම මෙහි ආරම්භක අදියර වේ. මෙම වාර්තාවෙන් එල්ලංගාවෙ පවතින ගැටලු හා උග්‍ර ගැටලු ලේඛණයක් හා අවශ්‍යතා හා විසඳුම් යෝජනා පිළිඹිමු වනු ඇත. මෙහි දෙවන අදියර වන්නේ මෙම මූලික පැතිකඩ පදනම් කරගෙන එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමයි. මෙම සැලැස්ම අදාල රාජ්‍ය ආයතන මගින් ක්‍රියාවට නැගීමත් ඒ සඳහා ප්‍රමානවත් ප්‍රතිපාදන ලෝක බැංකුව මගින් ලබාදීමත් මෙහි අවසන් අදියරවේ. මෙය මහත් බාරදූර වගකීමකි. ඒ අනුව නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් / එල්ලංගා කළමනාකරණ කමිටුවේ සභාපතිගේ ප්‍රධානත්වයෙන් සියලු අදාල රාජ්‍ය ආයතන වල හා ගොවි සංවිධාන වල සහභාගිත්වයෙන් වයඹ පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ අනුග්‍රහයෙන් 2023.09.06 වන දින මෙම හරස්කඩ වාරිකාව පවත්වන ලදී. එහි දී එල්ලංගාව හරහාබොහෝ භූමි දර්ශනයන් ආවරණය කරමින් මෙම වාරිකාව කි.මී. 12ක් පමණ දුරක් ගමන් කරන ලදී. මෙය මහත් දුෂ්කර මෙන්ම අවධානම් සහිත ගමනක් විය. මේ සඳහා කණ්ඩායම් 04 ක් වූ සහභාගිකයන් මුලු ගනණ 118 ක් යොදාගනු ලැබීය. මේ සඳහා පහත සඳහන් ආයතන සම්බන්ධ විය.

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- වනජීවී දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- මිරිදිය ධීවර අංශය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය (CSIAP NWP)

- දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපාති අංශය (PMU)
- ගොවි සංවිධාන
- වයඹ පළාත් සභාව

ඉහත සඳහන් කණ්ඩායම් 04 ට මෙම සියලු නිලධාරීන් බෙදී වාරිකාවට සම්බන්ධ විය.
ඒ ඒ කණ්ඩායම් ගමන් ගත් හා ආවරණය කල කෙෂත්‍රයන් මෙසේය.

<u>කණ්ඩායම අංක 01</u>

තම්මැන්නාවැටිය පන්සල අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය තම්මැන්වැටිය වැව, කුඹුරු පිච්චෙන්ඩියාව වැව හා කුඹුරු යාය සෙන්ගක්කුලම දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ ගමන් මාර්ගය කි.මී. 03 ක් පමණ.

<u>කණ්ඩායම 02</u>

පහල සන්දනංකුලම වැවේ සිට හල්මිල්ලවැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කි.මී. 03 ක් පමණ ගමන් මාර්ගය.

<u>කණ්ඩායම් අංක 03</u>

පහළ කුත්තිකුලම ඉහළ කුත්තිකුලම අතුරුපලයාගම දක්වා කුඹුරු හා ලඳු / කැලෑව ඔස්සේ වූ කි.මී. 03 පමණ මාර්ගය.

<u>කණ්ඩායම් අංක 04</u>

ඉහළ සන්දනංකුලම වැව, වෙලේ වැව කුඹුරු යාය ඔස්සේ ගල්ලෑව වැව හා දෙමට වැව දක්වා කුඹුරු හා කැලෑව ඔස්සේ වූ කි.මී. 3.5.

මෙදින හරස්කඩ වාරිකාව එදින උදේ 10.00 ට ආරම්භ කර සවස 3.00 ට පමන අවසන් වූ අතර තම්මැන්නාවැටිය විහාරස්ථානයට රැස්වූ පිරිස කෙටි සමාලෝචන රැස්වීමකින් පසුව විසිර යන ලදී.

ඉහත හරස්කඩ වාරිකාවෙන් ලබාගත් තොරතුරු පමනක් මෙම වාර්ථාවට ප්‍රමාණවත් නොවූ බැවින් රාජ්‍ය ආයතන වලින් ලබා ගන්නා ලද තොරතුරු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ පරිශීලනය කිරීමෙන්ද ගොවි සංවිධාන හා ගොවින්ගෙන් විවිධ අවස්ථාවලදී ලබාගත් තොරතුරු ද මෙම වාර්ථාව සඳහා පදනම් කරගනු ලැබීය.

1 .8 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින්

යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ.

1 ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම.

2 එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.

3 එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙළි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදි චිත්‍රයක් දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

02. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මැදවච්චිය එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරනය ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිළිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම

(ii) ද්විතීය දත්ත එකතු කිරීම

(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම

(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හදුනා ගැනීම

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම.

යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම.

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x) එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත් කර ඇත.

2.1 තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම

එල්ලංගා ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම

(ii) ද්විතීය දත්ත එකතු කිරීම

(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම

(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x) එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ගකාලීන වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන කමිටුවට ඇතුලත් කිරිම.

2. 2 මැදවච්චිය එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

මැදවච්චිය එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශිලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම්,

1. භූගෝල විද්‍යාත්මක
2. භූ විද්‍යාත්මක
3. ජල විද්‍යාත්මක
4. පාරිසරික විද්‍යාත්මක
5. මානව හැසිරීම්
6. සමාජ ආර්ථික

7. කෘෂිකාර්මික

8. වාරිමාර්ග කළමණාකරන

9. පෝෂිත ප්‍රදේශයේ තත්වය

යන ආදියයි. මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

3 මැදවච්චිය එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

3.1 භූගෝලීය (Geographical)තොරතුරු

මැදම්පිටිය එල්ලංගාව තරමක් කුඩා එල්ලංගාවකි. එහෙත් එහි වැව් 20 ක් පිහිටා ඇති අතර එල්ලංගාව බටහිර සිට නැගෙනහිර දෙසට කි.මී. 10 - 12 දක්වා විහිදී යයි. මොට්ටමොලේගල හා පිච්චෙන්ඩියාව කන්ද මෙම එල්ලංගාවේ පිහිටි ප්‍රධාන කඳුවැටි වේ. මේවා පිළිවෙලින් මී.80 ක් හා 125 ක පමණ උන්නතාංශයකින් යුක්ත වේ. පිච්චෙන්ඩියාව වැවට ගිණිකොණ දෙසින් මෙම කන්ද පිහිටා ඇත. මොට්ට මොලේ කන්ද පාමුල මොලේ වැව පිහිටා ඇත. මෙම වැව පිළිබඳව එල්ලංගාවේ මැනුම් හා තොරතුරුවල ඇතුලත් නොවේ. මෙම වැවට පහළින් ගල්ලෑව වැව පිහිටා ඇත. මෙම කඳු මුල්ලේගම කඳු වැටිය දක්වා විහිද යයි. මෙම කඳු වලින් ගලා එන ජලය කුඩා ඇල මාර්ග ඔස්සේ පිට්ටෙන්ඩියාව මොට්ටමොලේ වැව ගල්ලෑව හා දෙමටෑව යන වැව්ලට එකතු වේ. එල්ලංගාව තුල පිහිටි සෙසු වැව් වලට පහළින්ම පිහිටා ඇත්තේ ඉහල කූත්තිකුලම හා පහල කූත්තිකුලම වැව්ය. මෙම වැව්වලට පහළින් මැදවිටිය වැව පිහිටා ඇත. ප්‍රදේශය මුහුදු මට්ටමේ සිට මී. 52.5 ක් පමණ උන්නතාංශයකින් යුක්ත වේ. නැගෙනහිර සිට බටහිර දෙසට බෑවුම් වන භූමිය ලොකු කුඩා ජලාශ 20 කින් යුක්ත වේ. අලි ගහනය ඉතා බහුල බැවින් එම හානියෙන් ප්‍රදේශයේ වගාබිම් ආරක්ෂා කර ගැනීමට විශාල අගල් කපා අලි වැට සවිකර ඇත. මෙය නව භූගෝලීය භූමි දර්ශනයකි. මෙම නව භූගෝලිය ලක්ෂණයන් ක්‍රමයෙන් වර්ධනය වන තත්ත්වයකි. මේ සඳහා තම භූමියේ ප්‍රමාණය අනුව තරමක විශාල වියදමක් දැරිය යුතුය. මෙම තත්ත්වය නිසා ජල මාර්ගවල යම් වෙනස්කම්වලට හා බාධාවන්ට ලක්විය විය හැකිය. එහෙත් දැඩි පාංශු ඛාදනයට මෙය යම් විසඳුමක් වියහැකිය. එල්ලංගාව හරහා නවගත්තේගම සිට කරුවලගස් වැව දක්වා වන මාර්ගය වැටී ඇත. ඒ අනුව එල්ලංගාව තුල ගමන් පහසුකම් ඇත. මෙම මාර්ගය දෙපස 60% ක් පමණ වනාන්තර පිහිටා ඇත. සෙසු ප්‍රදේශ නිවාස හා ගොඩ ඉඩම්, ගෙවතු, හේන්, ගොඩ කුඹුරු දක්නට ලැබේ. සෑම නිවසක්ම හා ඉඩමක්ම පාහේ ආවරණය වන පරිදි “අලි වැට“ යොදා ඇත.

3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව හෙක්ටයාර් 1650 කින් යුක්තය. එහි 33% වනයෙන් ආවරණය වී. මෙම තත්වය නිසාම සතුන්ගේ හානි එල්ලංගාව තුල බහුල වී ඇත. ඉතිරි 64% භූමිය තුල වැව් ගොඩ ඉඩම් හා කුඹුරු පිහිටා ඇත. ගොවි පවුල් 324ක් වාසය කරයි. ගොවීන් වී වගාව හරුණු විට ගොඩ බෝග වගාවේ නිරතව ඇත. වැව් ආසන්නයේ හේන් වගාව දක්නට ඇතත් මෙවායේ වගාව මහ කන්නයට පමනක් සීමා වේ. මෙම වගාවේ අස්වැන්න නෙලන තුරු සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට ගොවීන්ට සිදුවී ඇත. විශේෂයෙන් වන අලින්ගෙනි. ගොඩ ඉඩම් වටා වගා ආරක්ෂිත අගල් යෙදීම ක්‍රමයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මෙය භූමි දර්ශණයේ සිදුවෙමින් පවතින නව වෙනස්වීමකි. එල්ලංගාව තුල එකම වර්ගයේ වෘක්ෂලතා දක්නට ඇත. වීර, පලු බහුලව දක්නට නැතත් මාදං, ඇහැල, එරමිනියා හා අන්දර බහුලව දැක ගතහැකිය. වැව් ඉස්මත්තේ කළපු අන්දර ගස් අතරින් පතර දැකගත හැකි මුත් බහුලව නැත. එහෙත් මෙය පාලනය කල යුතුය. එසේ නොකල හොත් මෙම වැව් කළපු අන්දර වලින් වැසී යාහැකිය. දැනටමත් මෙම ශාකය සන්දනංකුලම වැවට හානිදායි අයුරින් වර්ධනය වෙමින් ඇත. වැලි මිශ්‍ර මැටි හා රතු දුඹුරු පසකින් යුත් පාංශු කලාපයක් වන මෙහි විශේෂ ඛණිජ හෝ නිධි කිසිවෙක් දක්නට නැත.

3.3 ජල විද්‍යාත්මක තොරතුරු

එල්ලංගාව හරහා ගමන් කරනු ලබන විශේෂ ජල මූලාශ්‍ර නැති අතර එය කුඩා ජල ධාරාවන් කිහිපයක් මගින් පෝෂණය වේ. ඒවායේ වැසි කාලයට පමණක් ජලය ගලා බසින අතර වියලි කාලයේදී සිඳී යයි. පහත සඳහන් වර්ෂාපතන රටාව අනුව එල්ලංගාවේ ජලාශ වල ජල ධාරිතාවය උච්චාවචනය වේ.

වගුව - 5

	Average Monthly Rainfall (mm)												
Month	Anamaduwa Dispensary	Atharagalla	Dewahuwa	Giribawa	Inginimitiya	Karandipooval	Kottukachchiya	Maha Uswewa	Mahagalkadawala	Mediyawa Tank	Puttalam	Siyambalangamuwa	Tabbowa Irrigation
Jan	46	48	124	49	68	44	36	44	72	85	49	58	49
Feb	35	30	96	35	46	40	32	34	49	52	40	51	35
Mar	84	61	73	45	64	57	83	61	72	104	54	50	70
Apr	176	153	176	123	196	120	167	151	199	214	136	152	151
May	122	82	85	70	79	91	114	86	86	105	94	65	106
Jun	47	17	29	13	19	25	47	18	17	39	27	12	34
Jul	21	9	21	8	18	13	25	10	20	22	10	16	17
Aug	35	27	27	21	29	15	33	26	35	37	20	26	30
Sep	71	56	64	57	74	57	60	52	84	77	68	62	62
Oct	269	233	280	192	233	227	262	221	239	297	241	227	234
Nov	225	235	288	174	225	219	238	225	241	265	238	231	202
Dec	129	140	258	122	158	131	118	138	165	176	136	142	116

කොට්ටුකච්චිය, මහ උස්වැව, කරඩිපූවල්, ඉගිනිමිටිය වර්ෂාපතන දත්ත අනුව මැදවච්චිය එල්ලංගාවේ වර්ෂාපතනය පිළිබඳ නිර්ණය කල හැකිය. ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතන රටාව අනුව හා ඉහත සඳහන් ස්ථාන වල වර්ෂාපත මානයන්ගේ දත්ත අනුව ජූලි, අගෝස්තු, සැප්තැම්බර් මාස වල ඉතා අවම වර්ෂාපතනයක් පෙන්නුම් කරයි. තවද මැදවච්චිය එල්ලංගාවට ආසන්නයේම පිහිටි වර්ෂාපතන මධ්‍යස්ථානය වන්නේ මහ උස්වැවයි. එහි මි.මී. 10 දක්වා පහල යන වර්ෂාපතනය ප්‍රදේශයේ අවම වර්ෂාපතනයයි. උපරිම වර්ෂාව මි.මී. 225 ක් වන්නේ නොවැම්බර් මාසයේදී ය. එය දෙසැම්බර් මාසය වන විට 138 දක්වාද ජනවාරි මාසය වන විට 44 හා 38 දක්වා පහල යයි. මෙම දත්ත විශ්ලේෂණය එල්ලංගාවට ඉතා අවම වැස්සක් ලැබෙන බව කිවහැකිය. මෙම තත්වයන් සැලකිල්ලට ගෙන සුදුසු වගා සැලැස්මක් තීරණය කල යුතුය.

3.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගා පද්ධතිය තුල වැව් 20 ක් පවතින අතර වැව් 12 ක් දේශගුණ සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබයි. පහල කුත්තිකුලම, පිච්චෙන්ඩියාව, ගල්ලෑව, දෙමට වැව, අතුරුපලයාගම යන වැව් වන සංරක්ෂණ කලාපවලට මායිම්ව පවතී. නමුත් කිසිදු වැවක් වන සංරක්ෂණ කලාපය තුල පිහිටා නොමැත. හෙක්ටයාර් 547ක බිම් ප්‍රදේශයක් වන සංරක්ෂණ කලාප වශයෙන් පවතී. මෙම එල්ලංගාව තුල වැව් ප්‍රමාණයක

ගස් ගොම්මන හොඳින් පවතී. මෙම එල්ලංගා පද්ධතිය පරිසර හානි තරමක් අඩු එල්ලංගා පද්ධතියකි. මෙම එල්ලාංගාවේ දර්ශීය එල්ලංගාවක ලක්ශණ පවතී. හායනයට ලක් නොවූන පරිසර පද්ධතියක් පවතී. බොහොමයක් වැව් වල කට්ටකාඩුව සංවර්ධනය කල යුතු මට්ටමක පවති. වෙලේ වැව, සන්දලන්කුලම වැව, ඉහල කුත්තිකුලම වැව, පහල කුත්තිකුලම වැව, අතුරුපලයාගම, තම්මැන්නා වැටිය වැව යන වැව් වල තව දුරටත් කට්ටකාඩුව සංවර්ධනය කල යුතු මට්ටමක ඇත. මෙම වැව් වල ගස් ගොම්මන හොඳින් පවතී. එම නිසා තරමක් ආරක්ෂා වී ඇති එල්ලංගාවකි. එල්ලංගාව තුල සිදු කෙරෙන මානව ක්‍රියාකාරකම් නිසා යම් පරිසර හානියක් සිදුවෙමින් පවතී. අවිදිමත් ගව පාලනය නිසා ගවයින් රංචු පිටින් එල්ලංගාව තුල සැරිසරනු දැකිය හැකිය. අවුද්දේ වර්ශාව අඩු කාලයේදී අලි ගැවසෙන බව දැකගත හැකිය.

වැව් වලට ඉහලින් පවතින හේන් වගාවන් නිසා වර්ශාකාලයේදී පාංශු ඛාදනය සිදුවේ. නමුත් සමහර හෙන් වගාවන් වලට යොදන ලද අලි පැමිණීම අවහිර කරන අගල් නිසා වැව් ගොඩවීම විශාල ලෙස පාලනය වී ඇත. මහ කන්නයේ හේන් වගාවන් සිදු කරනු ලබයි. මේ සදහා ගිනි තැබීම් බහුලව දැකිය හැකිය. නමුත් වන සංරක්ෂණ කලාප වල හේන් වගාවන් සිදු නොකරන බව දැකගත හැකිය. වන සංරක්ශණ කලාපයේ සතුන් දඩයම් කිරීම සිදුවේ. වන සංරක්ශණ කලාප මැදින් ගවයින් ගමන් ගන්නා මාර්ග දැකගත හැකිය.

මෙම එල්ලංගාවවේ කුඹුක්, දං, කොහොඹ වැනි ශාක බහුලව දක්නට ලැබේ. කිරි ඉබ්බන් හා උරගයිද විශාල වශයෙන් ජීවත්වන බවට සාක්ෂි පවතී. මුවන් ගෝනුන් වැනි වන සතුන්ද සැලකිය හැකි ප්‍රමාණයක් සිටින බව ප්‍රරදේශවාසින් පවසයි.

කොතල හිඹුටු වැනි ඉතා වටිනා දුර්ලභ ඖෂද වර්ග වැව් ඉස්මත්තේ කැලෑ ප්‍රදේශයේ තවමත් පහසුවෙන් සොයා ගැනිමට හැකියාවක් පවතී. නමුත් මෙම දේශික ශාක වදවී යාමේ තර්ජනයක් පවතී. විශල වශයෙන් ආක්‍රමනික ශාක ව්‍යප්ත වීමක් දක්නට ලැබේ. හල්මිල්ලෑව වැවෙහි විශාල වශයෙන් ජපන් ජබර (*Eichhornia crassipes*) ව්‍යප්ත වී ඇත. තවද මෙම එල්ලංගාව තුල කලපු අන්දර (*Prosopis Juli flora*) ශාකයේ ව්‍යප්තිය විශාල වශයෙන් දක්නට ලැබේ. මෙම කලපු අන්දර ශාක හල්මිලෑව වැවෙහි ඉස්මත්ත වසාගනිමින් පවතී. පහල සන්දලන්කුලම වැවේ හා එල්ලංගාවේ අනෙකුත් ප්‍රදේශ වලද මෙම ශාකය ව්‍යප්ත වෙමින් පවතී. මේ නිසා වන සතුන්ට ආහාර හිග වීම, අනෙකුත් ඒකදේශික ශාක වර්ධනයට තර්ජනයක් වී ඇති බව පෙනේ.

3.5එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු

හෙක්. 1650 ක් වන එල්ලංගාව තුල කුඹුරු අක්කර 865 ක් පමන පිහිටා තිබුනද මහ කන්නයේදීවත් මෙම ප්‍රමාණය සම්පූර්ණයෙන් වගා නොකෙරේ. වර්ෂාපතන රටාව අනුව එල්ලංගාවට ලැබෙන ජලය ප්‍රමානවත් නොවීම එයට හේතුව වේ. අක්කර 130 පමණ බහු වාර්ෂික බෝග හා අතිරේක බෝග වගාකෙරේ. කෙසේ වෙතත් මහ කන්නයට සමස්ථ වගාව අක්කර 725 කට පමන සීමාවේ. කෘෂිකර්මය හැරුණු විට සත්ව පාලනය වැනි තාවකාලික රැකියා වල නිරත වේ. ඇතැම් පුද්ගලයන් ප්‍රදේශයෙන් පිටතට ගොස් රැකියා වල නිරතවේ. ගොඩ ඉඩම් පිටුපස හේන් වශයෙන් වගා බිම් අස්වද්දාගෙන සිටියද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම ඉඩම් වල වගාව තහනම් කර ඇත. එහෙත් මෙම ඉඩම් වල සීමා මායිම් ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතී. මෙම ඉඩම් වල රටකජු, බඩ ඉරිගු, තල හා උඳු වගාකෙරේ. සුලු වශයෙන් කෙසෙල්, වැඩිදියුණු කල කෙසෙල් හා අඹ, පේර, තුඹ කරවිල, නයි මිරිස් වැනි බෝග වගා කෙරේ. එල්ලංගාව තුල සත්ව පාලනයද සුලු වශයෙන් ඇතත් සමස්ථයක් වශයෙන් නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වශයෙන් ගත් විට මෙය සැලකිය යුතු කර්මාන්තයකි. දියර කිරි හා

මුදවන ලද කිරි නිශ්පාදනය කෙරේ. මානව හා ජීවනෝපාය ක්‍රියාවලියේ දී ජලය නොමැතිකම, අලි හානි හා ඒමගින් සිදුවන ජීවිත හානි, තරුණ කොටස් කෘෂිකර්මාන්තය හැරයාම වැනි කරුණු විශේෂත්වයක් ගනී.

3.6සමාජ ආර්ථික තොරතුරු

වලගම්බා රාජ සමයේ තම වාස භවන කරගත් එල්ලංගාව තම බලගන සේනාවට නායකත්වය දුන් දප්පුල නම් සෙනවියාට දුන් ගම් වරයක් ලෙස තම්මැන්වැටිය හැඳින්වේ. තවද මෙම ගමේ එම දප්පුල සෙනවියාගේ නමින් සේනාධිපති මුදියන්සේලාගේ හා පතිරාජ මුදියන්සේලාගේ පරම්පරාව අද දක්වාම පවතී. කුවේනිය මෙම ප්‍රදේශයේ ජීවත් වූ බවත් ගස් වැටියක් යොදාගෙන ආවරණය වෙමින් ජීවත් වූ ප්‍රදේශය තම්මැන්නා වැටිය ලෙස හඳුන්වන බවද කියයි.

මෙම ප්‍රදේශයේ ක්‍රම ක්‍රමයෙන් ජනගහන වර්ධනය වූ බවත් එම ජනගහනය අද දක්වා මෙම වැව් අමුණු යොදාගෙන කෘෂිකාර්මික කටටයුතුවල නිරත වී ඇත. කුඹුරු අක්කර 685 ප්‍රදේශය වගාවට යොදාගෙන ඇති අතර ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. බහු වාර්ෂික භෝග වගාව අක්කර 13 ක් පමණ වන අතර මේ යටතේ කජු, පොල්, කෙසෙල් වගා කෙරේ. මීට අමතරව සත්ත්ව පාලනය ද දක්නට ලැබේ. එළු පාලනය, ගව හා කුකුළු පාලනය එල්ලංගාව තුල සුළු වශයෙන් දක්නට ලැබේ. ප්‍රදේශයේ වැඩිහිටි ජනගහනය දෙස බලනවිට වයස්ගත වූවන්ගේ සංඛ්‍යාව ඉතා වැඩි ය. අක්කර 60 ට වැඩි ගැහැණු 190 ක් හා පිරිමි 175 ක් ජීවත් වේ. අවුරුදු 25 - 30 අතර සංඛ්‍යාව පිළිවෙලින් 55 - 71 දක්වා වේ. මේ අනුව පෝෂණය කළ යුතු වැඩිහිටි ජනගහනයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. එමෙන්ම සමස්ථ ජනගහනයේ පුරුෂ ජනගහනය 397 වන විට කාන්තා ජනගහනය 428 කි.
ප්‍රදේශයේ අලි ගහනය ඉතා උග්‍රය. වී වගාව හැරුණු විට සුළු වශයෙන් ගොඩ ඉඩම් වගාව සිදු කරයි. එළවළු හා අඹ වගාව සුළු වශයෙන් වගා කර ඇත.

3.7එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් කටයුතු පිලිබඳ තොරතුරු

එල්ලංගාව තුල විශේෂ ඉදිකිරීම් දක්නට නැත. එහෙත් එල්ලංගාව හරහා නවගත්තේගම සිට කරුවලගස් වැව මාර්ගයේ පදිංචිය සඳහා නිවාස, වෙළදාම සඳහා ගොඩනැගිලි සුලු වශයෙන්ද ඉදිවෙමින් පවතී. මීට අමතරව වගාව සඳහා සිදුකෙරෙමින් පවතින විවිධ ඉදිකිරීම් දක්නට ලැබේ. අලි වැට, බාදක අගල්, කොන්ක්‍රිට් වැට දැකිය හැක. ඉදිකිරීම් අතරින් මේ දින වල විශේෂත්වයක් ගන්නේ

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන වාරි කර්මාන්ත සම්බන්ධයෙනි. එල්ලංගාවි පිහිටි වැව් 20 අතරින් 12ක් පුණරුත්ථාපනය කෙරේ. වැව් බැම්ම, වාන, සොරොව් රොන් මඩ ඉවත් කිරීම් මේ දින වල සිදුකෙරේ. මෙම ඉදිකිරීම් සමග විශාල පස් ප්‍රමාණයක් විතැන් වී ඇත. තව ද රොන්මඩ ඉවත් කිරීම් හා සුද්ධ පවිත්‍ර කිරීම් නිසා බැහැර කරනු ලබන දෑ අක්‍රමික ලෙස බැහැර කර ඇත. මේ අනුව ලැබෙන වර්ෂාව නිසා එල්ලංගාව තුල පාංශු අනු විශාල වසයෙන් සේදී ගොස් පහත් බිම් වල තැම්පත් වීම වැලැක්විය නොහැකිය.

3.8. එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා පිලිබඳ තොරතුරු

මැදවච්චිය එල්ලංගාව වර්ග කි.මී. 16.5 කින් යුක්තය. ප්‍රදේශය රතු දුඹුරු පැහැ වැලි පසකින් සමන්විතය. වන සංරක්ෂණ කැලෑව හෙක්ටයාර් 547 කින් යුක්තය. සියලු වැව් ඉස්මත්ත හේන් වගාව ද සැලකිය යුතු මට්ටමකින් පැවතුනද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කැලෑව හේන් වගාව වශයෙන් යොදා ගැනීම තහනම් කර ඇත. ඒ අනුව පදිංචිය, ගොඩ ඉඩම් වගාව හා හේන පවතින්නේ එකම පද්ධතියක් ලෙසිනි. එහෙත් ඉඩමේ පිටුපස හේන වගාව දැනට පාලනය වී ඇත. එල්ලංගාව තුල වැව් 15 ක් පවතී. මෙයට අමතරව වාර්තා නොවන ඉතා කුඩා වැව් ද තවත් 05 ක් පමණ ඇත. එල්ලංගාවේ සෙසු කෘෂිකාර්මික කටයුතු පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී කුඹුරු වගාව පිළිබඳව පහත සඳහන් වගුව පිළිබඳ තොරතුරු වැදගත් වේ.

වගුව - 6

වගා කන්නය	වගාකල හැකි කුඹුරු ප්‍රමාණය	වගාකල කුඹුරු ප්‍රමාණය
2020/21 මහ කන්නය	හෙක්. 685	හෙක්. 348
2021 යල	හෙක්. 685	හෙක්. 252

මූලාශ්‍රය - ගොවිජන සං.දෙ. - නවගත්තේගම

ඉහත වගුව අනුව මහ කන්නයේ දී සමස්ථ කුඹුරු ප්‍රමාණය වගාකර නොමැති බව පෙනේ. හෙක්. 685 ක් වන කුඹුරු ඉඩම්වලින් වගා කර ඇත්තේ හෙක්. 348 ක් පමණි. එය යල කන්නයේ දී හෙක්. 252 දක්වා පහල බැස ඇත. පසුගිය දා පැවති හරස්කඩ චාරිකාවේ දී මේ බව හොඳින්ම තහවුරු විය. වී වගාවට අමතරව වෙනත් බහු වාර්ෂික භෝග වගාවන් පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී එල්ලංගාව තුල පොල් වගා කරන ගොවීන් 33 ක් බවත් පොල් වගාව අක්කර 12 ක් බවත් සටහන් වේ. කජු අක්කර 05 ක් ද, එලවළු වගාව අක්කර 114 ක් බව අනාවරණය වේ. මීට අමතරව TOMEJC අඹ හා දොඩම් වගාව සුළු වශයෙන් දක්නට ලැබේ. මෙම අඹ වගාවෙන් හොඳ ආදායමක් ලබා ගන්නා බව ගොවීන් පවසති. අලි ගහනය ඉතා ඉහළය. ඒ අනුව වගාවන් රැකගැනීම සඳහා ගොවීන් මහත් වෙහෙසක් දරයි. තම වගා ඉඩම් වටා විශාල අගල් කැපීමටත් ආරක්ෂිත අලිවැට යෙදීමටත් ගොවීන් පෙළඹී ඇත. මෙම තත්ත්වය

ප්‍රදේශය පුරා ක්‍රමයෙන් ව්‍යාප්ත වන බවක් පෙනේ. ප්‍රදේශයේ පවතින පසේ ස්වභාවන් හා හොඳින් ලැබෙන සූර්ය රශ්මිය උපයෝගී කර ගනිමින් ගොඩ ඉඩම්වල සුදුසු වගාවන් ආරම්භ කිරීමට හැකිය. මේ සඳහා ස්ථිර ජල මූලාශ්‍රයක් අවශ්‍ය වේ. එල්ලංගාව තුළ වී වගාව සමස්ථයක් වශයෙන් අක්කර 685 ක් පමන වේ. මීට අමතරව සෙසු භෝග වගාවන් මෙසේය.

වගුව 8 - 2022.01.23 වගා කන්නය (කන්න රැස්වීම)

භෝගය	ඉලක්ක	වගා ප්‍රගතිය අක්.
බඩඉරිගු	86	15
කුරක්කන්	15	-
මුං ඇට	17	5
රට කජු	25	10
කව්පි	10	05
උදු	10	05
මිරිස්	10	02
වට්ටක්කා	03	02
පතෝල		20
කොමඩු		02
කැකිරි		03

මූලාශ්‍රය - ගොවිජන සං.දෙ. නවගත්තේගම

ඉහත වගු සටහන අනුව 2022/23 මහ කන්නයේ ඉලක්ක ගත වගා රටාව සඳහන් වේ. නව වගා සැලැස්ම අනුව ඉලක්ක ප්‍රමාණය හා ප්‍රගතිය සැලකිල්ලට ගැනීමේ දී 50% කට වඩා අඩු ප්‍රගතියක් පෙන්වයි. මීට අමතරව විවිධ කෘෂි උපකරණ දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් ලබා දී ඇතත් එම කටයුතු නිසි පරිදි මෙහෙයවමින් කෘෂිකාර්මික කටයුතු සඳහා ගොවීන් ක්‍රියාවේ යෙදවීමේ ගැටළුවක් පවතී.

වගුව 9 - වැව් අනුව වගා තොරතුරු

අංක	වැවේ නම	අක්කර ප්‍රමාණය	ගොවීන් සංඛ්‍යාව	යල කන්නය		මහ කන්නය		ගොවි සංවිධානය
				වී	වෙනත්	වී	වෙනත්	
1	ඉහල කුත්තිකුලම	32	33	x	X	13	x	සුළු ගොවි සංවිධානය
2	අතුරු පලායාම	52	68	x	x	52	x	
3	පහල කුත්තිකුලම	30	25	x	x	30	x	සරුකෙත ගොවි සංවිධානය
4	පිච්චෙන්ඩියාව	20	13	x	x	20	x	රංකෙත ගොවි සංවිධානය
5	ගල්ලෑව	7.5	06	x	x	7.5	x	
6	වෙලේවැව	31	90	x	x	31	x	
7	පහල සෙන්ගක්කුලම	110	116	x	x	110	x	
8	හල්මිල්ලෑව	67	86	x	x	67	x	
9	පහල සන්දනන්කුලම	110	115	x	x	110	x	
10	ඉහල සන්දනන්කුලම	10	02	x	x	10	x	
11	දෙමටෑව	12	06	x	x	12	x	
12	තම්මැන්නාවැටිය	27	70	x	x	27	x	

3.8.1 එල්ලංගා පද්ධතියේ කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිකිරීම හා බෝග රටා පිළිබඳ සංවර්ධන යෝජනා.

මැදවච්චිය එල්ලංගා පද්ධතිය වැව් 20 කින් සමන්විතය. එහි ජල පෝෂක ප්‍රදේශය හෙක්. 1660 පමණ වන අතර ගොඩ ඉඩම් ප්‍රමාණය හෙක්. 570 කි. මෙහි වී වගාව, ගෙවතු වගාව හා හේන් වගාවද සිදුකරනු ලබයි. මෙයට ගොවි පවුල් 324ක් පමණ අයත්ය. එයින් ගොවි පවුල් 324ක් ස්ථිරව මෙම එල්ලංගා පද්ධතිය තුල ජීවත්වන අතර අනෙක් පිරිස ඊට ආසන්නව ගම්මානවල පදිංචිව සිට කෘෂිකාර්මික කටයුතු වල නිරත වේ. මෙම එල්ලංගා පද්ධතියට අදාල ප්‍රදේශයට යල සහ මහ කන්න වලදී වර්ෂාපතනය ලැබෙන අතර එය මි.මී. 950 ට වඩා අඩු අගයකි. මෙහි පස විශාල වශයෙන් රතු දුඹුරු වන අතර එහි සමහර ප්‍රදේශ වල වැලි මිශ්‍ර ලෝම පස්ද දක්නට ලැබේ. තවද මෙම එල්ලංගා පද්ධතියට යාබදව වන සංරක්ෂණයට අයත් කැලෑ ප්‍රදේශයක්ද දක්නට ලැබේ.

මහ කන්නයේදී එල්ලංගා පද්ධතියේ වැව් වලට ලැබෙන ජලය භාවිතා කර වී වගාව සිදු කරනා අතර එහි ගෙවතු ආශ්‍රිතව ගෙවතු වගාව මෙන්ම ගොඩ ඉඩම්වල හේන් වගාව සිදුකරනු ලබයි. එම ගොඩ ඉඩම්වල එළවලු වගාව මෙන්ම ස්ථිර බෝග ලෙස අඹ, පොල්, කෙසෙල් ඇතුළුව අනෙකුත් වගාවන්ද වගා කරනු බව දක්නට ලැබේ. තවද විශේෂයෙන්ම මහ කන්නයේදී ගොඩ ඉඩම්වල මුන් ඇට, කවුපි, උඳු, රටකජු, තල, මිරිස්, බඩ ඉරිඟු යනාදී වගාවන්ද දක්නට ලැබේ. යල කන්නයේදී වැව් සඳහා ලැබෙන ජලය ප්‍රමාණවත් නොවීම නිසා වී වගාව ඉතාමත් අඩුවෙන් සිදුකරන අතර සමහර ගොවීන් විසින් මුන් ඇට, රටකජු වැනි මාංශ බෝග එම කුඹුරු වල සුළු වශයෙන් වගා කරනු ලබයි. තවද මෙම එල්ලංගා පද්ධතිය තුල ගවයින් නිදැල්ලේ හැසිරෙන බවටත් ගවපාලනය අවිධිමත් ලෙස සිදුකරනු ලබන බවත් පැහැදිලිය.

මැදවච්චිය එල්ලංගා පද්ධතියේ දිගුකාලීන තිරසාර සාර්ථකත්වය උදෙසා දේශගුණ සුහුරු කෘෂිකාර්මික සැලැස්මට තිරසාර කෘෂිකාර්මික තාක්‍ෂණය හා ජල පෝෂක කළමනාකරණය මෙන්ම දේශගුණ බලපෑම් වලට ඔරොත්තු දිය හැකි සාර්ථකත්වයෙන් යුත් මුල ධර්ම හා ඒකාබද්ධ කිරීම කල යුතුව ඇත. තවද දිගුකාලින සාර්ථකත්වය උදෙසා එහි පාර්ශවකරුවන් අතර සහයෝගිතාව වර්ධනය මෙන්ම ඔවුනොවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ප්‍රමුඛතාවය අනුව කටයුතු සැලසුම් සකස් කල යුතුය.

මැදවච්චිය එල්ලංගා පද්ධතියේ කෘෂිකාර්මික ඵලදයිතාවය වැඩි කිරීම හා දේශගුණ බලපෑම් වලින් කෘෂිකාර්මික කටයුතුවලට සිදුවන බලපෑම අවම කිරීම හෝ සීමා කිරීම මෙන්ම ජලාධාර කළමනාකරණය වැඩි කිරීම සඳහා පහත සඳහන් දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ප්‍රමුඛත්වය අනුව සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුව ඇත.

01. දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා සුදුසු දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හඳුනා ගැනීම. මෙම ක්‍රියාකාරකම් සඳහා බෝග විවිධාන්ගිකරණය, අවම බිම් සැකැසීම, කෘෂි වන වගාව පිහිටුවීම හා පාංශු ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම, පාංශු පෝෂකත්වය වැඩි කිරීම පාංශු සංරක්ෂණය කිරීම හා ජල සම්පත් මනාව ආරක්ෂා කර ගැනීම කල යුතුය.

02. කෘෂිකාර්මික බෝග රටාවන් සඳහා ජල භාවිතය තිරසාරව තහවුරු කිරීම සඳහා දේශගුණ සුහුරු කෘෂිකාර්මික සැලැස්ම සඳහාවූ ඒකාබද්ධ ජල කළමනාකරණ ක්‍රමවේදයක් යොදාගැනීම, ජලය රැස් කිරීම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරීමේ තාක්ෂනයන් යොදාගැනීම හා ජල සම්පත් ආරක්ෂා කරගැනීම කල යුතුය.

03. හරිත වායු විමෝචනය අවම කිරීම හෝ අඩු කිරීම සඳහා සුදුසු යෝග්‍ය කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හඳුන්වාදීම (උදා සූර්ය ජල පොම්ප භාවිතය, කොම්පෝස්ට් පොහොර භාවිතය, ගිනි තැබීම අවම කිරීම හා නිවැරදි පොහොර භාවිතය යනාදී).

04. යෝග්‍ය හා දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් පිළිබඳ තාක්‍ෂණ කුසලතාවයන් වැඩිකිරීම සඳහා ගොවීන්ට පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා එම තාක්ෂණය අනෙකුත් ගොවීන් සමග හුවමාරු කරගැනීමට අවශ්‍ය කටයුතු සකස් කිරීම.

05. එල්ලංගා පද්ධතියේ ගොවීන් සඳහා අමතර අදායම් මාර්ග හඳුන්වාදීමේ ක්‍රමවේදයන් දේශගුණ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රියාකාරකම් හරහා හඳුන්වාදීම. (උදා: - අගය එකතුකළ කෘෂි නිෂ්පාදන, බිම්මල් වගාව, කිරි ආශ්‍රිත නිෂ්පාදන හා ගම් බිත්තර නිෂ්පාදනය යනාදී).

06. වෙළඳපොල ඉලක්ක කරගත් තිරසාරව අඛණ්ඩ දිගුකාලීන අදායම් මාර්ග ලැබෙන කෘෂි බෝග රටාවන් හඳුන්වාදීම. (උදා: - අඹ, පොල්, කෙසෙල්, දොඩම්, පේර යනාදී).

07. වී වගා ගොවීන්ගේ කෘෂි ඵලදායිතාව වැඩි කිරීම සඳහා යාන්ත්‍රිකරණය හා පැරෂුට් වී වගා ක්‍රම හඳුන්වාදීම.

08. දේශගුණ සුහුරු කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන් හඳුන්වාදීම හා කෘෂි තාක්ෂණය හඳුන්වාදීම තුලින් කෘෂි ඵලදායිතාව වැඩිකිරීම.

09. කෘමි හා වන සතුන්ගෙන් කෘෂි බෝග ආරක්ෂා කර ගැනීමේ ක්‍රම හඳුන්වාදීම.

10. ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මනාව මෙහෙයවීම හා ඇගයීම සඳහා ක්‍රමවේද හඳුන්වාදීම.

3.9. මැදවච්චිය එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය පිලිබඳ තොරතුරු

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 20 කි. වැව් 12 ක් පිළිබඳව තොරතුරු හා පුනරුත්ථපන කටයුතු සිදුවේ. මීට අමතරව තවත් වැව් 08 ක් පිහටා ඇත. මින් වැව් 03 ක් කැලෑව තුල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සීමාවේ පිහිටා ඇති අතර ඒවා හානියට පත්වී ඇත. මෙම වැව් යටතේ ඇති කුඹුරු සුලු වශයෙන් වගා කරන්නේ ඊට යාබද වැව් වල ජලය උපයෝගි කරගෙනය. මෙම වැව් බොහොමයක් ඉතා කුඩා වන අතර අක් 02 සිට 14 දක්වා පරාසයකින් යුක්තව වගා බිම් පවතී. එහෙත් එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබඳව වැදගත්කමක් ඇත. විශේෂයෙන්ම කැලෑව තුල පවතින වැව් පුණරුත්ථාපනය කරන්නේ නම් එහි රඳවාගත හැකි ජලධාරිතාවය වැදගත් වේ.

වගුව 09 - පුණරුත්ථාපනයට හසු නොවූ වැව් පිළිබඳ තොරතුරු

අංක	වැවේ නම	ගොවීන් සංඛ්‍යාව	අක්කර
01	මොට්ටමොලේ වැව	04	12
02	පත්තිල්ලෑව වැව	03	14
03	කුඩාවැව	10	02/10
04	තරණගහවැව	08	09
05	සියඹලාගහ වැව	11	11
06	තල්ගහ වැව	10	10

07	හබ වැව	2	28
08	කොරකහවැව	04	08

මූලාශ්‍රය ගොවි ජන සං.දෙ. නවගත්තේගම

කුඹුරු අක්කර 10 ක් පමණ අස්වද්දා ඇතත් වගාව අක්කර 02 පමනි.

- කැළෑව තුල පිහිටි වැව්

මෙම වැව් 20 ම ගොවි සංවිධාන 03 කින් ආවරණය කෙරේ. ජල පාලකවරුන් සෑම වසරකම අලුතෙන් පත්කරන්නේ කන්න රැස්වීමේදීය. ඇතැම් ජල පාලකයන් එකදිගටම කිහිප වරක් පත්වෙන්නේ ගොවීනන්ගේ කැමැත්තෙනි. පද්ධතියේ මෙහෙයුම්, මහා නඩත්තුව ගෙවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුව අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත මුදල් ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්භ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ වගා කෙරේ. මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මහ කන්නයේදී අඛණ්ඩව වගාවන් සිදු නොවන අතර සමහර වැව් වල කන්න ගණනාවක් මහ කන්නයේදී පවා වගා කර නොමැත. කැලෑව තුල පිහිටියා වූද එම වැව් යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් ඇතත් ඒවා වගා නොකෙරේ.

වගුව 10 - ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය

	Average Monthly Rainfall (mm)												
Month	Anamaduwa Dispensary	Atharagalla	Dewahuwa	Giribawa	Inginimitiya	Karandipooval	Kottukachchiya	Maha Uswewa	Mahagalkadawala	Mediyawa Tank	Puttalam	Siyambalangamuwa	Tabbowa Irrigation
Jan	46	48	124	49	68	44	36	44	72	85	49	58	49
Feb	35	30	96	35	46	40	32	34	49	52	40	51	35
Mar	84	61	73	45	64	57	83	61	72	104	54	50	70
Apr	176	153	176	123	196	120	167	151	199	214	136	152	151
May	122	82	85	70	79	91	114	86	86	105	94	65	106
Jun	47	17	29	13	19	25	47	18	17	39	27	12	34
Jul	21	9	21	8	18	13	25	10	20	22	10	16	17
Aug	35	27	27	21	29	15	33	26	35	37	20	26	30
Sep	71	56	64	57	74	57	60	52	84	77	68	62	62
Oct	269	233	280	192	233	227	262	221	239	297	241	227	234
Nov	225	235	288	174	225	219	238	225	241	265	238	231	202
Dec	129	140	258	122	158	131	118	138	165	176	136	142	116

ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ඉහත වගුව තුලින් දක්වා ඇත. මෙම සටහන් අනුව එල්ලංගාව ආසන්නයේම මහ උස්වැව වැසි මාන තොරතුරු අනුව ඉතා අවම වර්ෂාපතනයක් මෙම වසර තුල දක්කවා ඇත. දැනට එල්ලංගාවේ පිහිටි සෑම වැවකම ජලය බෙදා දීම මුර ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර ඒ අනුව එක් එක් ගොවියාට පැය කිහිපයක් පමණක් ජලය ලබාදේ. එහෙත් ඇතැම් ගොවීන් තම අභිප්‍රාය අනුව ජලය ලබාගැනීම නිසා විධිමත් ජල පාලනයක් සිදු නොවේ. සියලුම වැව්වල වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත. විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ වේ. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරින්ගේ මතය වී ඇත. ඇල පද්ධතිය ඉතා අබලන්ය. මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය. ඇතැම් ඇලමාර්ග කුණු ඇලට ජලය හරවා කුණු ඇල පුරවා කුඹුරු වලට ජලය හරවා ගැනීමට ගොවීන් කටයුතු කරයි. ඒඅනුව ජල කළමනාකරණයක් පිළිබඳව කථා කිරීමට පෙර පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කලයුතුය.

04.එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

මැදවච්චිය එල්ලංගාවේ පසුගිය දා (06/09/2023) පැවති හරස්කඩ චාරිකාවේ දී මෙන්ම ගොවි සංවිධාන සමග පැවති සාකච්ඡා, නිලධාරීන් සමග හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකිවිය. එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසුව 20/09/2023 දින තම්මැන්නාවැටිය විහාරස්ථානයේ ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේ දී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකි විය. මෙසේ හඳුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත .

4.1 එල්ලංගාවේ උග්‍ර ගැටළු ප්‍රමුඛතාවය අනුව

1. කෘෂිකාර්මික කටයුතු සඳහා විධිමත් සැළසුමක් නොමැකි බව, ධරිද්‍රතාවය වේගයෙන් ඉහල යන බව, සුලු පරිමාණ වගාවන්ගෙන් මෙයට විසඳුමක් නොලැබෙන බව, ගොඩ හා මඩ වගා කර ගැනීමට ප්‍රමාණවත් ජලය නැත.
2 වැව් පරිසර පද්ධතියේ තිබූ කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන නොමැතිකම, ඉස්වැටිය විනාශ කිරීම, වැව් ඉවුරු ඛාදනය, රොන්මඩ තැන්පත් වීම හා කුඹුරු ලවණතාවය ඉහල යාම.
3 හල්මිල්ලෑව හා සන්දනංකුලම වැව් තුල ආක්‍රමණික ශාක (කලපු අන්දර) විශාල වශයෙන් වර්ධනය වෙමින් පවතී. මෙම ශාක ඉවත්කිරීම.

4 මිරිදිය ධීවර සම්පත විනාශ වී ඇත.

5 මැදවච්චිය එල්ලංගාවේ අභ්‍යයන්තර කෘෂිමාර්ග කිලෝමීටර 04 ක් පමන දුර්වලයි.

6 ගොවි සංවිධාන 03 ක කළමනාකරණය දුර්වලයි.

7 පිච්චෙන්ඩියාව හා සෙන්ගක්කුලම වැව් වල ජලය ගෙන යන ඇල මාර්ග මීටර් 400 ක් පමණ ඉතා දුර්වලයි. කුඹුරුවලට ජලය ගෙන යා නොහැකිය.

8 පිච්චෙන්ඩියාව වැවේ වාන් වතුරෙන් ගෙවල් 05 ක් යටවේ.

9 පිච්චෙන්ඩියාව වැව ඉස්මත්තේ සහ පිච්චනේඩියාව කන්දේ පුරාවිද්‍යා වටිනාකමක් ඇති භූමිය අනාරක්ෂිතයි. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නැත.

4.2 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

අනු අංක	උග්‍ර ගැටළු	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්
1	යල කන්නයේ ජලය හිගයි වගා කල නොහැකිය. ආදායම් මාර්ගයක් නැත.	i. අදාල ගොවි සංවිධාන හා අදාල ආයතන සමග සාකච්චාවක් පැවැත්වීම ii. සහභාගිත්ව සුදුසු වගා සැලැස්මක් සකස් කිරීම iii. සුදුසු බිම් හදුනාගැනීම හා ගොවීන් තෝරාගැනීම පුහුණු කිරීම iv. ක්ෂේත්‍ර අධ්‍යන චාරිකා දෙකක් සංවිධානය කර පැවැත්වීම v. උපකරණ /බීජ /පැල ලබා දී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
2	එල්ලංගාවේ වැව් 12 ක පරිසර පද්ධතිය දුර්වලයි. (කට්ට කඩුව නැත ගස්ගොම්මන නැත පෙරහණ නැත පාංශු ඛාදනය සිදුවේ)	i. අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම ii. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම iii. කට්ටකඩුව නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ට කඩුව වෙන් කිරීම. iv. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම v. කුණු ඇල හා රක්ෂිත වෙන් කිරීම හා ගොඩ දැමීම vi. කුණු ඇල රක්ෂිත දෙපස සුදුසු ශාක සිටුවීම vii. පෙරහන හා ගස්ගොම්මන ස්ථාපිත කිරීම viii. ගොවීන් තෝරාගැනීම පුහුණු කිරීම vi. ක්ෂේත්‍ර අධ්‍යන
3	හල්මිල්ලැව හා සන්දනංකුලම වැව් තුල ආක්‍රමණික ශාක (කලපු අන්දර) විශාල වශයෙන් වර්ධනය වෙමින් පවතී.	i. එල්ලංගා කළමනාකරණ කමිටුව ඒකාබද්ධ ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම ii. ඒකාබද්ධ සැලසුමක් සකස් කිරීම කලපු අන්දර ඉවත් කිරීම iii. නැවත වනවගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම

4	මිරිදිය ධීවර මත්ස්‍ය සම්පත් නොමැතිකම.	i. එල්ලංගා කළමනාකරණ කමිටුව මිරිදිය ධීවර අංෂය සමග කථිෂා කිරීම ii. සුදුසු වැව් තෝරා ගැනීම iii. නියමිත කාලයට අනුව මසුන් 40000 මුදා හැරීම (ඇගිල්ලන්) iv. ගොවීන් 150 ක් පුහුණු කිරීම හා ඒකාබද්ධ මිරිදිය ධීවර සමිතියක් පිහිටුවීම අධීක්ෂණය
5	මැදවච්චිය කැස්කැඩ්හි අභ්‍යන්තර කෘෂි මාර්ග කිලෝමීටර 04 ක් පමන දුර්වලයි.	i. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම ii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම ඇස්තමේන්තුවක් ලබාගැනීම iii. ප්‍රතිපාදන සපයා ගැනීම iv. ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම
6	ගොවි සංවිධාන 03 ක කළමනාකරණය දුර්වලයි.	i. ගොවීන්ට සහ ගොවි සංවිධාන නායකයින්ට පුහුණු වැඩසටහන් 3ක් පැවැත්වීම ii. වැව සහ ඇළවල් ක්‍රමානුකූලව නඩත්තු කිරීම සඳහා නඩත්තු සැලැස්මක් සැකසීම සඳහා ගොවි සංවිධානයට සහාය ලබා දීම iii. නිරන්තරව හා අඛණ්ඩව ඇලවල් නඩත්තු කිරීම සඳහා සෑම ගොවි සංවිධානයකටම තණකොල කපන යන්ත්‍රයක් ලබා දීම
7	පිච්චෙන්ඩියාව හා සෙන්ගක්කුලම වැව් වල ජලය ගෙන යන ඇල මාර්ග මීටර් 400 ක් පමණ ඉතා දුර්වලයි. කුඹුරුවලට ජලය ගෙන යා නොහැකිය.	I. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම ii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම iii. ප්‍රතිපාදන සපයා ගැනීම iv. ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම

8	පිච්චෙන්ඩියාව වැවේ වාන් වතුරෙන් යටවෙන ගෙවල් 05 ක පදිංචිකරුවන් සමග සාකච්චාවක් පැවැත්වීම.	i. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම ii. අදාල ආයතන දැනුවත් කිරීම iii. පසු විපරම
9	පිච්චෙන්ඩියාව වැව ඉස්මත්තේ සහ පිච්චනේඩියාව කන්දේ පුරාවිද්‍යා වටිනාකමක් ඇති භූමිය අණාරක්ෂිතයි. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නැත.	i. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම ii. අදාල ආයතන දැනුවත් කිරීම iii. පසු විපරම

05.යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව

උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම	දළ පිරිවැය (රු.මි.)	කාලරාමුව														ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත්වීම්	
		කෙටි කාලීන						මධ්‍යකාලීන				දිගුකාලීන				ප්‍රධාන	අනෙකුත්
1 ගොවි සංවිධාන හා අදාල ආයතන සමග සාකච්චාවක් පැවැත්වීම	3															ගොවි සංවිධානය පලාත් කෘෂි දෙපා. ප්‍රා.ලේ.කා පොලිසිය	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
සුදුසු බිම් හදුනාගැනීම සහභාගිත්ව සුදුසු වගා සැලැස්මක් සකස් කිරීම ගොවීන් තෝරාගැනීම																	
ගොවීන් දැනුවත්/ පුහුණු කිරීම																	
ප්‍රතිපාදන සපයා ගැනීම බීජ ලබා දීම																	
වගාව පිහිටුවීම හා අධීක්ෂණය																	

2 පරිසර පද්ධතිය සංවර්ධනය කිරීමට නියමිත වැව් තෝරා ගැනීම	6															ගොවි සංවිධානය ගොවිජන සං.දෙ.	ප්‍රා. ලේ. කාර්යාලය ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව පොලිසිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ඉලක්ක ගත භූමිය තෝරාගැනීම																එම	එම
නියමිත කාර්යයන් ගිවිසුම් මගින් භාරදීම																එම	එම
නියමිත කාලයට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම																එම	එම
අධීක්ෂණය																එම	එම
3 එල්ලංගා කළමනාකරණ කමිටුව ඒකාබද්ධ ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම හා කලපු අන්දර ව්‍යාප්ත වූ ප්‍රදේශ නිශ්චය කිරීම	3															එල්ලංගා කළමනාකරණ කමිටුව	පාර්ශවකරුවන් ගොවි සංවිධාන

																පොලිසිය	දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය ඉ. කො. දෙපාර්ථමේන්තුව මිනින්දෝරු
ආක්‍රමනික ශාඛ (කලපු අන්දර) විනාශ කිරීම පිළිබදව නියමිත උපදෙස් ලබාදීම																එල්ලංගා කළමනාකරණ කමිටුව පොලිසිය Forest Department	පාර්ෂවකරුවන් ගොවි සංවිධාන දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය ඉ. කො. දෙපාර්ථමේන්තුව මිනින්දෝරු
අධීක්ෂණය																එම	එම
4 මිරිදිය ධීවර අංශය සමග සාකච්ඡා කර සුදුසු වැව් තෝරා ගැනීම	4															එල්ලංගා කළමනාකරණ කමිටුව ගොවි සංවිධාන මිරිදිය ධීවර අංශය	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
නියමිත කාලයට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම																එම	එම
මිරිදිය ධීවර කටයුතු පිළිබදව ගොවීන් 150 ක් සදහා කළාඹය මිරිදිය ධීවර පුහුණු																මිරිදිය ධීවර අංශය දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය	

මධ්‍යස්ථානයේදී පුහුණුවක් ලබාදීම																	ගොවි සංවිධාන
5 අලුත්වැඩියා කලයුතු කෘෂි මාර්ග පරීක්ෂා කිරීම	4															ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රා. ලේ. කා ගොවිජන සංවර්ධන	දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP) .
ඇස්තමේන්තු ලබාගැනීම																ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රා. ලේ. කා. ප්‍රාදේශීය සභාව	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මව්‍යාපෘතිය ගොවි සංවිධාන
ගොවි සංවිධාන මගින් කොන්ත්‍රාත් ඉටු කිරීමට පැවරීම																ප්‍රා. ලේ. කා. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය සභාව	ගොවි සංවිධාන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
6 ගොවි සංවිධාන කළමනාකරණය චපිළිබඳ පුහුණු වැඩ සටහන - 1	2															ගොවි සංවිධාන දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP) ගොවිජන සං. දෙ.	

																ප්‍රා. ලේ. කාර්යාලය	
ගොවි සංවිධාන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන - 2																ගොවි සංවිධාන දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP) ගොවිජන සං. දෙ. ප්‍රා. ලේ. කාර්යාලය	
ගොවි සංවිධාන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන - 3																ගොවි සංවිධාන දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP) ගොවිජන සං. දෙ. ප්‍රා. ලේ. කාර්යාලය	
7 පිච්චෙන්ඩියාව හා සෙන්ගක්කුලම වැව් දෙකේ මීටර් 400 පමන වන ඇල මාර්ග පරීක්ෂා කර බලා සුදුසු ඇස්තමේන්තුවක් සෑදීම	2															ගොවි සංවිධාන ගොවිජන සං. දෙ. ප්‍රා. ලේ. කාර්යාලය .	දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP)

කොන්ත්‍රාත්කරුට පැවරීම හා අධීක්ෂණය																ගොවි සංවිධාන ගොවිජන සං. දෙ. ප්‍රා. ලේ. කාර්යාලය ප. වාරි. දෙපා.	ගොවි සංවිධාන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
8 පිච්චෙන්ඩියාව වැවේ වාන් වතුරෙන් යටවෙන ගෙවල් 05 ක පදිංචිකරුවන් සමග සාකච්චාවක් පැවැත්වීම																ගොවි සංවිධාන පළාත් වාරි. දෙපා. ගොවි ජන සං. දෙ. ප්‍රා. ලේ. කාර්යාලය	දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP)
සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල ආයතන වෙත පැවරීමව																ගොවි සංවිධාන ප. වාරි. දෙපා. ගොවි ජන සං. දෙ. ප්‍රා. ලේ. කාර්යාලය	දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP)
9 පිච්චෙන්ඩියාව වැව ඉස්මත්තේ සහ පිච්චනේඩියාව කන්දේ පුරාවිද්‍යා වටිනාකමක් ඇති භූමිය අණාරක්ෂිතයි.																ගොවි සංවිධාන එල්ලංගා කළමණාකරන කමිටුව පුරාවිද්‍යා දෙපාර්ථමේන්තුව	දේ. සු. වා. කෘ. ව්‍යා. (CSIAP)
	24																

6.0

ඇස්තමේන්තුගත වියදම - 23.265

7.0 ක්‍රියාත්මක සැලැස්ම මැදවච්චිය එල්ලංගා

අනු අංක	ඇස්තමේන්තුගත වියදම සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් - මැදවච්චිය		ආසන්න වියදම (රු.මි.)	2024							
				මාර්	අප්‍රි	මැයි	ජුනි	ජූලි	අගෝ	සැප්	
1	යල කන්නයේ අක් 300 ක අතිරේක ආහාර බෝග ආදර්ෂ වගාවක් සැලසුම් කිරීම හා ගොවීන් 125 ක් පුහුණු කිරීම.		3								
2	වැව් 12ක පර්සර පද්ධතිය දුර්වලයි (හෙක්. 12 කට්ටකඩුව සංවර්ධනය, හෙක්. 02 ක ගස්ගොම්මන පිහිටුවීම, 05 km පෙරහන පිහිටුවීම, 6 km ක පාංශු සංරක්ෂණ වැටි දැමීම).		6								
3	හල්මිල්ල වැව හා සෙන්ගක්කුලම වැව් වල ආක්‍රමණශීලී ශාක (කළපු අන්දර) හෙක්ටයාර 10 ක් ඉවත්කිරීම.		3								
4	වැව් 12 ක මිරිදිය ධීවර මත්ස්‍ය සම්පත සංවර්ධනය සඳහා ඇගිල්ලන් 400000 ක් මුදා හැරීම හා ගොවීන් 150 ක් පුහුණු කිරීම (කළා වැව මිරිදිය ධීවර පුහුණු මධ්‍යස්ථානය).		4								
5	මැදවච්චිය එල්ලංගාවේ කි. මි. 04 ක අභ්‍යන්තර මාර්ග සංවර්ධනය (කුරුකැටියාව මාර්ගය).		4								
6	ගොවි සංවධාන 03 ක කළමනාකරණය දියුනු කිරීම සඳහා පුහුණු වැඩසටන් 3 ක් පැවැත්වීම.		2								

7	පිච්චෙන්ඩියාව හා සෙන්ගක්කුලම වැව් දෙකේ මීටර් 400 පමන වන ඇල මාර්ග සංවර්ධනය.		2								
8	පිච්චෙන්ඩියාව වැවේ වාන් වතුරෙන් යටවෙන ගෙවල් 05 ක පදිංචිකරුවන්ගේ ගැටලුව විසඳීමට මැදිහත්වීම.										
9	අනාරක්ෂිතව පවතින මොට්ටමොලේ ගල පුරාවිද්‍යා රක්ෂිතයේ ආරක්ෂාව තාවුරු කිරීම										
	මුළු එකතුව		24								

එල්ලංගා කළමණාකරන සැලැස්මේ ක්‍රියාත්මක තත්වය සොයාබැලීම (Monitoring), පසුවිපරම එල්ලංගා කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම එල්ලංගා කළමණාකරන කමිටුවට පැවරේ. ඒ අනුව උප ව්‍යාපෘති වාර්ථා අනුමත කිරීම, ඒ සඳහා අරමුදල් සපයා ගැනීම, ක්‍රියාත්මක තත්වය සොයාබැලීම, පසුවිපරම කිරීම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සිදු කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව විසින් අනුමත කරනු ලබන සෑම වැඩසටහනක්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම එල්ලංගා කළමණාකරන කමිටුවේ සාමාජිකයන් වන ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත පැවරේ.

එල්ලංගා කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ තත්වය ඒ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන විසින් පසුවිපරම කලයුතු පසුවිපරම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන ආයතන හා එම ආයතන විසින් කලයුතු කාලය පහත වගුවෙහි දැක්වේ.

වගු අංක15 -

එල්ලංගා කළමණාකරන සැලැස්ම සොයාබැලීම කල යුතු ආයතන	කාලය
• ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	මාස 6කට වරක්
• දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව	මාස 2කට වරක්
• ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව	මාසිකව
• එල්ලංගා කළමණාකරන කමිටුව	මාසිකව
• ක්‍රියාත්මක කිරීමේ ආයතන	මාසිකව
• සමාජ විගණන කමිටුව	සතිපතා

එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් ප්‍රධාන ක්‍රියාකාරකම් සොයාබැලීම කිරීම සඳහා නිශ්චිත(Specific), මැනිය හැකි (Measurable), ළඟාකර ගත හැකි (Achievable), තාත්වික (Realistic), කාලරාමුවක් (Time Bound) සහිත, කාර්ය සාධන දර්ශක (Key Performance Indicator – KPI) සකස් කල යුතුය. එම කාර්ය සාධන දර්ශක මැනිය හැකි ආකාරයට අවශ්‍ය තොරතුරු ලබා ගෙන අදාල ආයතන විසින් ක්‍රියාත්මක සැලැස්ම සොයාබැලීම කල යුතුය.මෙම තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර සැකසිය යුතුය. එල්ලංගා කළමණාකරන සැලැස්මේ ක්‍රියාත්මක තත්වය පිලිබඳ තොරතුරු ගලා යන ආකාරය පහත අංක රූපසටහනින් දැක්වේ.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව

ගොවිජන සංවර්ධන
දෙපාර්තමේන්තුව

ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව

එල්ලංගා කළමණාකරන
කමිටුව

සමාජ විගණන කමිටුව

ඇමුණුම්

ඇමුණුම් 1

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය எனது இல. My No.	7/3/9/CMC/2023	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023.08.03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>

<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම්, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා දෙනතුන් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මෙ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරී හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරී හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ ඒකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.

3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමානාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

ඇමුණුම් අංක 02

හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය

1. නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
7. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව - පුත්තලම
8. ගොවි සංවිධානය - සරුකෙත
9. ගොවි සංවිධානය - රන්කෙත
10. ගොවි සංවිධානය - අතුරුපාලයාගම

ඇමුණුම් අංක 03

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සහ එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා සහභාගී වූ ආයතන වල ලේඛණය

1. නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
5. දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය,පුත්තලම
6. ගොවි සංවිධානය - සරුකෙත
7. ගොවි සංවිධානය - රන්කෙත
8. ගොවි සංවිධානය - අතුරුපාලයාගම